දකුණු පළාත් ආණ්ඩුකාර
ලේකම් කාර්යාලය,
1994-11-30
ගාල්ල.



1990 අංක.07 දරණ දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ එකතු කරනලද මුද්දර ගාස්තු දකුණු පළාතේ පළාත්පාලන ආයතනවලට හැරවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසවූ ප්‍රඥප්තියකි.

:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:v:

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

**ලුහුඬු නාමය.**

1. මේ ප්‍රඥප්තිය 1994 අංක. 4 දරණ දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මුද්දර ගාස්තු හැරවීම.**

2. 1990 අංක.07 දරණ දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය සහ 1992 අංක.02 දරණ දකුණු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර, පළාත්සභාව විසින් දකුණු පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලනය සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අයකර, එකතුකර, දකුණු පළාතේ පළාත්සභා අරමුදලට ගෙවා ඇති අවස්ථාවක පළාත් සභාව විසින් ඒ මුද්දර ගාස්තුව අයකර එකතු කරනු ලැබුවේ යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් ද, ඒ නිශ්චල දේපල පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවක් ඇතුළතද ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන නිලධාරියා විසින්, ඉහත කී පරිදි ඒ මුද්දර ගාස්තුව අයකර, එකතු කරනලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින සිට අවුරුදු 02 ක් වූ කාල සීමාවක් ඇතුළත දකුණු පළාතේ පළාත් අමාත්‍ය මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා වෙත, ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන ලද විට, පළාත් සභාව විසින් ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුවේ මුදල හැරවිය හැකිය.

" මෙම වගන්තියේ කාල සීමාව පිළිබඳව සඳහන් නියමයන් මෙම ප්‍රඥප්තිය සම්මතවීමට පෙර, වර්ෂයන්ට බලනොපැවැත්විය යුතුය."

**රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සහතිකය.**

3. 2 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද කිසිම හිමිකමක්, ඒ හිමිකමෙහි සඳහන් කරනලද මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඔහු වෙනුවෙන් නම්කරන ලද වෙනත් යම් නිලධරයෙකු විසින් සහතික කරන ලද දකුණු පළාත් සභාව විසින් නියම කරන ආකාරයක, උපලේඛනයක් ඒ හිමිකම සමඟ ඉදිරිපත් කරනු නොලැබුවහොත්, වලංගු නොවන්නේය.

(...2

4. මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය කළහොත් මිස " ප්‍රධාන පරිපාලන නිලධාරියා " යන්න-

(අ) මහනගර සභාවක් සම්බන්ධයෙන් යෙදෙනවිට, ඉන් එහි නාගරික කොමසාරිස්වරයා ; සහ

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් යෙදෙනවිට, ඉන් එහි ලේකම්වරයා අදහස් වේ.

" පළාත් පාලන ආයතනය " යන්නෙන් යම් මහනගර සභාවක් , නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි සභාවන් විසින් ක්‍රියාත්මක කරන බලතලවලට සහ කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා පිහිටුවනු ලබන වෙනත් යම් අධිකාරියක්ද ඊට ඇතුළත් වේ;

" සාධන පත්‍රය" යන්නෙහි 1990 අංක.07 දරණ දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ ඇති අර්ථයම ඇත්තේය ;

" පළාත් සභාව" යන්නෙන්, ශ්‍රී ලංකා ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවයක් ඇතිවූ විට, සිංහල පාඨය බල පැවැත්විය යුතු බව.

5. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇතිවූ විටක, සිංහල භාෂා පාඨය බල පවත්නේය.